388



# කණිෂ්ඨ ද්විතීය පාසලේ සමාජ අධ්‍යයනය විෂය අරමුණු ඉටු කරගැනීම සඳහා ගුරුවරුන් අනුගමනය කරන ක්‍රියා මාර්ග පිළිබඳව නිකවැරටිය අධ්‍යාපන කොට්ඨාශය ඇසුරින් කෙරෙන අධ්‍යයනයක්. ...........

අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධනය....

අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්ව විද්‍යාලය,
ශ්‍රී ලංකාව.
1996

එම්.එම්. සිරිමල්යාමී,
(එම්.පිල්. 14)
අධ්‍යාපනවේදී.

UCLIB
464389

## සංක්ෂේපයෙක්

සමාජ අධ්‍යයනය යනු මූලික වශයෙන්ම මිනිසාගේ දියුණුව සඳහා කරන අධ්‍යයනයයි. මෙම මූලික කාර්යය ඉටුකරගැනීමේ අදහස පෙරදැරි කරගෙන ශිෂ්‍යයාගේ සමාජ හැකියාව ඇතිකිරීම සඳහා 1970 දශකයේ මුල් භාගයේ ශ්‍රී ලංකාවේ පාසල් විෂය මාලාවට එක් වූ මෙම විෂයය වසර විස්සකට අධික කාලයක් විවිධ ගතිකත්වයන්ට භාජනය වෙමින් අද දක්වාත් අපේ පාසල් විෂය මාලාවේ ප්‍රධාන විෂයයක් ලෙස ක්‍රියාත්මක වේ.

විශිෂ්ඨ අරමුණු රාශියක් ඉටු කර ගැනීම තුළින් ඉතා යහපත් සමාජයකට අවශ්‍ය සමාජ හැකියාවන් සහිත පුරවැසියන් බිහි කිරීමට මෙම විෂයය කාලාන්තරයක් තිස්සේ ක්‍රියාත්මක වීම හේතුවෙන් හැකිවී ඇත්ද යන්න සොයා බැලීමේදී සතුටු විය හැකි තත්ත්වයක් අපට නැත. විචල්‍යයන් රැසක බලපෑම මත සිදුවන සමාජ පරිහානිය හෝ විශිෂ්ඨ වර්ධනය පිළිබඳ වගකීම ඒකාන්ත වශයෙන්ම සමාජ අධ්‍යයන විෂයයට පැවරීම අපහසු වෙතත් එමගින් ප්‍රධාන වූ කාර්ය භාරයක් ඉටු කළ හැකි බව පිළිගත යුතුය.

මෙම තත්ත්වය ළඟා කර ගැනීමට නම් සම්මත කරගත් විෂය අරමුණු වලට ළඟා වීම අත්‍යාවශ්‍ය බව පැහැදිලිය. එසේ වුවත් සමාජ අධ්‍යයනය විෂයයේ පුළුල් වූ අරමුණු පිළිබඳව එය උගන්වන ගුරුවරුන් තුළ පවතින අනවබෝධයත් විශේෂිත පුහුණුවක් නොලද ගුරුවරුන් විසින් විෂයය ඉගැන්වීමට අත ගැසීම නිසා අරමුණු ගයකට ගෝ ස්වකීය මත මතාන්තර ඉස්මතු වී තිබීමත්, විෂයය අරමුණු ඉටු කර ගැනීමට ආනුෂාංගික වැඩ පිළිවෙළක් නොමැති වීමත්, මේ සියල්ල මත සිසුන්ගේ සාධනයේ පවත්නා දුර්වලතාත් තැපී පෙනෙන්නට පටන් ගෙන ඇත.

මේ නිසා සමාජ අධ්‍යයන ගුරුවරයා සතු විය යුතු සුවිශේෂ කාර්යභාරය හා ඔහු කුමන ආකාරයක සංජානනයකින් මෙම විෂයය ඉගැන්වීමේ කාර්යභාරයට අත ගසා ඇත්දැයි විමසා බැලීමත් ඔවුන් විසින් සමාජ අධ්‍යයන ය විෂයයේ අරමුණුවලට ළඟාවීමේදී අනුගමනය කරන පිළිවෙත් හා ක්‍රමෝපක්‍රම පිළිබඳව සොයා බැලීමත්, පවත්නා තත්ත්වයන් තුළ ශිෂ්‍යයාගේ සමාජ අධ්‍යයනය විෂය සාධනය පිළිබඳ [illegible] තත්ත්වයන් අනාවරණය කිරීමත් මෙම අධ්‍යයනය මගින් සිදු වූ අතර වැදගත් සමාජ මෙහෙවරක් ඉටුකිරීමට සමාජ අධ්‍යයනය විෂයය ඉගැන්වීමේදී ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව යෝජනා ඉදිරිපත් කිරීමට ද මෙම අධ්‍යයනය මගින් හැකි විය.

නිකාවැරටිය අධ්‍යාපන කොට්ඨාශය කේන්ද්‍ර කරගෙන මෙම අධ්‍යයනය දියත් වුවද සමස්ත දිවයිනේ අධ්‍යාපනය පිළිබඳව පැතිකඩක් ලෙස සලකා මෙම තොරතුරු මුළු ශ්‍රී ලංකාවටම සාමාන්‍යකරණය කිරීමට වුවද හැකියාව තිබේ. කෙසේ වෙතත් මෙම ප්‍රශ්නය මඟින් අනාවරණය වූ තත්වයන් හේතු කොට ගෙන සමාජ අධ්‍යයනය විෂයය ඉගැන්වීමේදී අරමුණු සාක්ෂාත් කරගැනීමට ගුරුවරුන් අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග පිළිබඳව යථාර්ථවාදී නව පිවිසුමක් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඇති වේ යැයි අපේක්ෂා කළ හැකි බව ප්‍රකාශ කළ යුතුව ඇත.

එම්. එම්. සිරිමල්ලාමි.

University of Colombo Sri Lanka Library